




සහන් වීරසේකර

## ලාංකීය ජනශ්‍රැතිය ඔස්සේ ජන විඥ්ඥාණය අස්වැද්දූ මහා ගුරුතුමා හෙවත් උඩුවේ ගැමියා




මොහොතකට වටපිටාව මහා නිසොල්මනක් දැනිණි. මගේ මනස හොරණ උඩුවේ නම් වූ තවමත් නාගරික අමන බැල්ම අඩුවෙන් වැටී ඇති සුන්දර පියස්සට යන ගමන්, දෑස සක්මන් කරන්න වුයේ පර්ත් නුවර රංජිත් ලොක්කගේ කුටුම්භයේ පියානෝව පිහිටි ඉස්සවුවටය. "අනේ අපේ තම්පලා කොටුව" ....බැද්දගේ ශූරීන් මුමුණයි, වම් අතේ ඇගිලි තුඩු පියනොවේ දීගේ දිවයයි. මා කවදාවත් නොදුටු දසුනක්. පියානෝවේ හඬ උස් පහත් වේ .. "අනේ අපේ තම්පලා කොටුව" තවත් ජන ආරක නව සංගීත ශ්‍රැතියක් බිහිවන මොහොතක්. උණුසුම් තේ කෝප්පයක් මොහොතකට දැහැන් බිදී. බැද්දගේ ශූරීන් බුද්දක සමග සංවාදයට එක් වෙයි.

ජීවිතෙන් බාගයයි කියලා කතාවක් තියෙනවා. වරක් පඬිතුමා ඔරුවේ ගියා, මාටිං ගොයියා ඔරුව පැද්දා. ඔන්න ඔරුව වතුරේ ඇදෙද්දී පඬිතුමා අහනවා මාටිං ගොයියාගෙන් "ඈ මාටිං අයියේ උඹ කොච්චර දුරට ඉගෙනගෙන තියෙනවාද" "පහේ පන්තියට ආයිබෝවන්.."
"ඉතින් බලන්න උඹ ඉගෙන ගත්තේ නැති හන්දා හැමදාම ඔරුව පදිනවා. හරියට ජීවිතයෙන් භාගයයි නේද?" සමච්චලේට කියාපිය. ඔන්න ගග මැද වඩදිය පාරට ඔරුව පෙරලුනා. පඬිතුමා ද මාටිං ගොයියාද වතුරේ. කෙසේ හෝ මාටින් අයියා වතුරේ ගිලෙන පඬිතුමා කෙස්වැටියෙන් ඇදගෙනවිත් ඔරුව මත තිබ්බා.
"අනේ පඬිතුමා, පීනන්න දන්නේ නෑ නේද, ඉතින් ජීවිතෙන් බාගයයි" කියලා කීවා, කහට උගුරක රස බලමින් බැද්දගේ ශූරීන් ඔහුට ආවේනික ජන කතා රස මතුකරමින් කට පලල්කර මුහුණින් අනුග්‍රහය ප්‍රකාශ කර සිනහා වුනා.

කවර ජනශ්‍රැතියකට වුවද පාදක වන්නේ ජනයා ජීවිතය හා පරිසරය ඇසුරින් ලබන අත්දැකීම් හා හැඟීම් දැනීම් ය. පරිසරය මිනිස් අවශ්‍යතා සඳහා ගලපා ගන්නා ආකාරය තුළ මිනිසා අත්දැකීම් ලබා ගනී. අතීත මිනිසා ස්වභාව ධර්මයේ විවිධ සංසිද්ධි පිළිබඳ යථාරූපීව වටහා ගත නොහැකි වූ තැන ඒවාට ජීවත්වාරෝපණයක් දී වැඳුම් පිදුම් කිරීමටත්, විවිධ විශ්වාස පද්ධති ගොඩනගා ගැනීමටත් පුරුදු විය. ඒවා ජනශ්‍රැතිය ඔස්සේ පැවත එමින් අතීත ජන විඥ්ඥාණය හෙළි කරයි. ජනශ්‍රැතියේ සෑම අංගයකම ජන විඥ්ඥාණය ගැබ්ව ඇති බවයි බුද්දකගේ මතය.

ජන විඥ්ඥාණය යනු ජනශ්‍රැතියේ ගැබ්ව ඇති මානවයාගේ ආකල්ප, සංකල්ප, හැඟීම්, දැනීම් ආදියයි. ජනශ්‍රැතියේ වාච්‍යාර්ථයට ඉඳුරාම විරුද්ධ අදහසක් අභ්‍යන්තර වශයෙන් අඩංගු විය හැකිය. ජනශ්‍රැතිය ආශ්‍රයෙන් ගැමි ජන සංස්කෘතිය පරීක්ෂා කරන කල ඒ දෙස මතුපිටින් බැලීම පමණක් නොසෑහේ. එහි බාහිර පෙනුම හෙවත් දෘශ්‍ය මානය විනිවිද යාමෙන් අන්තර්ගත හරය අවබෝධ කර ගත යුතුය. ජන කවියක, ජන කතාවක හෝ ජනප්‍රවාදයක දෘශ්‍යමානයට හාත්පසින් ම විරුද්ධ වූ අදහසක්‍ෟ එහි ගැබ්ව තිබීමට පුළුවන. බැද්දගේ ශූරීන් ජන කතාවේ ජීවිත පැතිකඩක අපූරුව මනාවට අපට පෙන්නා දෙයි.

කන්දේ ලන්දේ * ගඟු ලැල්ලේ පේනා තෙක් මානේ ...කට හඬ අවදී වේ. උප්පැන්නේ හැටියට අවුරුදු 82ක තරුණ මානසික ශක්ති ජවයක් පිරුණු මිනිසෙක් මා අභියස. උඩුවේ ගේ පියස්සේ එලියට බැස දකින සුන්දරත්වය, කදු මානය, බොරළු වැටුණු ගම් මාවත, පාලු සොහොන් පිටි, රබර් යාය, වන අරණ, දිය මංකඩ සහ කුඹුරු යාය හරි අපුරුයි. කුඹුරේ කමතේ වැඩ කොරන එක අපිට සාමාන්‍යයි බැද්දගේ ශූරීන් හොදින් මා දෙස බලයි. මං ගමේ එකෙක් හරි ආඩම්බරයෙන් කියයි.

මේ ගම්මානේ කඳුවැටි සීමාවේ
ලස්සන වන අරණේ තිබුණා * සේනාසනේ
ඒ අසපුවෙහී වැඩහුන්
ඒ කාලේ පොඩි හාමුදුරුවො නෑ දැන් ඒ *
සේනාසනේ...

බැද්දගේ ශූරීන් බෙරයට බර දෙමින් අපිට ගයයි. නැටුම් ගුරුවරයකු ලෙස බොහෝ දෙනෙක් දන්නා බැද්දගේ ශූරීන් මුල් යුගයේ සරත්චන්ද්‍ර උන්නැහේගේ මනමේ නාට්‍ය කණ්ඩායමේ බට නලා වාදක තෙමේ බව බොහෝ දෙනෙක් දන්නේ නෑ. ගමේ වෙසක් ටීටර් හී රගපෑ බැද්දගේ පුංචි තුමෝ, පසුව 1962 දී බළල් ශාස්තරේ නාට්‍යය රචනා කොට නිෂ්පාදනය කරමින් පොදු නාට්‍ය තලයට පිවිසියා. කොළඹ ලුම්බිණි රංග ශාලාවේ දර්ශනයට දයානන්ද ගුණවර්ධන, අයිරාංගනී සේරසිංහ වැනි කලාකරුවන් සාක්ෂි දරුවා. හේමසිරියාගේ මුල්ම වේදිකා ප්‍රධාන චරිතේ ඕක...බැද්දගේ ශූරීන් සිනහා වේ.

හේමසිරි ලියනගේ නම්වූ අපූරු රංගධරයාගේ කෝඩුකාර වේදිකා චරිත ආගමනය වුයේ බළල් ශාස්තරේ වේදිකා නාට්‍යයයි. රෝහණගේ අලකලංචිය වේදිකා නාට්‍යය ද ගැමි ජීවන සුවඳ විහිදු වන්නකි. රංගනය, නැටුමේ පන්නරය, සරත්චන්ද්‍ර ගුරු හිතෝපදේශය සහ ජන කතාවේ ජීවන බද්දතාවයේ දැනුම, බැද්දගේ ශූරීන් මහා තලයකට කැඳවුවා. බළල් ශාස්ත්‍රයට විෂය වූයේ අපේ ජන කතාවකි. ඔහු එතැන් සිට පනස් වසරක් මුළුල්ලේ කලාවට යාදී සිටියේ ද ජන කතාව ජන කවිය ජන ශ්‍රැතිය සහ ජන සංගීතය ඇසුරු කොට ගෙන වීම විශේෂයකි. එහෙයින් රෝහණ බැද්දගේ කලාකරුවා අපේ ජන සංස්කෘතියේම තවත් නිර්මාණයකි. ජන සංස්කෘතිය මෙරට ජනතාව අතරටද එතෙර ජනතාව අතරටද රැගෙන යන දූතයෙකි.

වරක් තාරක පුතු සහ බැද්දගේ ශූරීන් ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවක සජීව රූප මෙහෙයුමකට සැරසෙමින් සිටියා. බැද්දගේ ශූරීන් වම් පස පනවා ඇති ආසනයක සහ ඒ අසලින්ම තාරකටත් ඇදී ගන්න නියම විය. දැන් සියල්ලම සුදානම් ඒත් තාරක කිසියම් පීඩාවකින් සිටින බව කාටත් අවබෝධ විය. වැඩ සටහන ආරම්භ විය. නිවේදක තුමෝ දෙපලම පිළිගෙන මුලින්ම බැද්දගේ ශූරීන් ආමන්ත්‍රණය කර තාරක දෙසට හැරී පවතින ආතතිය පිළිබඳ ප්‍රශ්ණ කළේය. එවිට ඔහු පැවසු දේ අප කාටත් සිතන්න පමණක් නොව ජීවිතය විදින්නත් ඉවහල් වේ. අද තමයි මම තාත්තට සමාන්තරව පුටුවක ඉද ගත්තේ. ඔලුව තිබුනේ බරක් හෙමින් අත ඇරියා. ඊළඟ ප්‍රශ්නය වුයේ ඔබේ පියා කවුද යන වගයි. තාරක ගේ සංවේදී පිළිතුර වුයේ තාත්තාගේ මුහුණ දෙස බලන්න උත්තරය එතැන තියෙනවා. වැඩිහිටි ගරුත්වය සහ විනය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහා ගුරුතුමන්ගේ පවුල් පසුබිම තුල දක්නට තිබුණා.

වරක බැද්දගේ ශූරීන් කලා කටයුත්තකට මහනුවර බලා ගමන් කරනවා. සුනංගු වී ඇති නිසා රියදුරා රථය වේගවත් කලා. කෑගල්ල පසු කලා විතරයි පාරට පැනපි පොලිස් රාලහාමි කෙනෙක්. රෝහණ බැද්දගේ ගේ නවතම නාට්‍ය නිර්මාණය රාළහාමි නම් වෙයි. නාට්‍යයට ඇතුළත් වන රාළහාමි ද එම සමාජය ද දක්නට ලැබුණේ බැද්දගේ ශූරීන් නාට්‍ය කලාවට පිවිසි අවදියට පෙර කාලයේ වීම විශේෂයකි. අප රටෙහි රාලහාමි ක්‍රමය නැති කොට ග්‍රාමසේවක ක්‍රමය ආරම්භ වූයේ 60 දශකයේ මුල් වකවානුවේදීය. එබැවින් රාළහාමි ක්‍රමය සහ එම සමාජය පිළිබඳ සමීප අත්දැකීම් වත්මන් සමාජයේ වැඩි දෙනකුට නැත. රාළහාමි යනු ඉංග්‍රීසි පාලන සමයේ ආරච්චිල ලෙස ආරම්භ වී පසුව ගම්මුලාදෑනි ලෙස හැඳින්වුණු ප්‍රබල චරිතයකි. නූගත් ගැමි සමාජයේ සර්ව බලධාරියා වූයේද මෙම පහළම පෙළේ රාජ්‍ය නිලධාරියාය. සරම සහ පොලිස් කබායේ පැහැය ගත් දුඹුරු කාකි කබාය ඔහුගේ ඇඳුමයි. මේ අතරේ දඩ කොලය ලියන්නට කෑගල්ලේ පොලිස් රාලහාමි තීරණය කරයි. රියදුරු දෙස විපරමින් බලයි. ප්‍රශ්න අසයි.

එකල්හී රාජ්‍ය ලාංඡනය වූ ඔටුන්න සහිත පිත්තල බොත්තම් ඔහුගේ තේජස දෙගුණ කළේය. ඔහු අල්ලස් ගත්තේ මුදලින් නොවේ. අල්ලස දීමට තරම් මුදල් එකල ගැමියන් අත නොවීය. ස්ත්‍රීන්, දඩමස් සහ අස්වැන්න අල්ලස් අඩුව පිරවීය. රෝහණ බැද්දගේ මෙම අපූරු චරිතය වටා නාට්‍යමය අවස්ථා ගොඩනංවා අප අතීත සමාජයට කැටුව යයි. ඉහත සඳහන් වස්තු විෂය පමණක් වුවද රාළහාමි නාට්‍යයේ විශේෂත්වයට හේතු වෙයි. දඩ කොලය ලියන්නට කෑගල්ලේ පොලිස් රාලහාමි දැඩිසේ තටමන දුටු බැද්දගේ ශූරීන් ඔය කොලේ ඉක්මනට දෙනවද නැත්නම් අපි 100ට පාගලා යන්නද යයි ඇසුවේ, සියල්ලෝම සිනහා ගන්වමින්. පොලිස්

36 වන පිටට